2015 ජූනි 23 දිනැති මෙහි ඉංග්‍රීසි පිටපත මත මෙම පරිවර්තිත ව.ද.ප පාදක වේ.

# ව්‍යාපෘති දත්ත පත්‍රය

ව්‍යාපෘති සහ වැඩසටහන් සම්බන්ධ සාරාංශගත කරන ලද තොරතුරු ව්‍යාපෘති දත්ත පත්‍රවල අඩංගු වේ. ව්‍යාපෘති දත්ත පත්‍රිකාවක් යනු වැඩ කෙරෙමින් පවතින ව්‍යාපෘති සම්බන්ධ වාර්තාවක් බැවින් ඇතැම් තොරතුරු මෙහි පළමු පිටපත් වල ඇතුළත් නොවිය හැකි අතර එකී තොරතුරු ලැබෙන පරිදි ඇතුලත් කරනු ඇත. යෝජිත ව්‍යාපෘති සම්බන්ධ තොරතුරු තාවකාලික සහ හඟවන තොරතුරු වේ.

| | |
|---|---|
| **ව්‍යාපෘති දත්ත පත්‍රය සැකසූ දිනය** | – |
| **ව්‍යාපෘති දත්ත පත්‍රය යාවත්කාලීන කරන ලද්දේ** | 2015 ජූනි 3 |

| | |
|---|---|
| **ව්‍යාපෘති නාමය** | යටිතල පහසුකම් සංවර්ධනයට සහය වීම සඳහා හැටන් නැෂනල් බැංකුවට යෝජිත ණය මුදල |
| **ණය ලබා ගන්නා/ හිමිකම් ආයෝජන නාමය** | හැටන් නැෂනල් බැංකුව |
| **රට** | ශ්‍රී ලංකාව |
| **ව්‍යාපෘති/ වැඩසටහන් අංකය** | 48302-001 |
| **තත්වය** | අනුමැතිය ලැබී ඇත |
| **භූගෝලීය පිහිටීම** | – |

රාජ්‍ය වැඩසටහනක් හෝ ක්‍රමෝපාය සැකසීමේදී, ව්‍යාපෘතිය මූල්‍යනය කිරීමේදී හෝ මෙම වාර්තාවේ යම් භූගෝලීය සීමාවක් සටහන් කිරීමේදී ඕනෑම ප්‍රදේශයක් හෝ භූමි සීමාවක් සම්බන්ධ නෛතික හෝ වෙනයම් තත්වයන් සම්බන්ධයෙන් ආසියානු සංවර්ධන බැංකුව විසින් කිසිදු මත දැක්වීමක් සිදුකිරීමට අපේක්ෂා නොකරයි.

| | |
|---|---|
| **ක්ෂේත්‍රය සහ/ හෝ උපක්ෂේත්‍ර වර්ගීකරණය** | මූල්‍ය |
| **අනුක්ෂේත්‍රය** | මූල්‍ය අංශය සංවර්ධනය<br>යටිතල පහසුකම් මූල්‍යනය සහ ආයෝජන අරමුදල් |
| **ක්‍රමෝපාය න්‍යාය පත්‍රය** | සමස්ත ආර්ථික වර්ධනය (IEG) |
| **වෙනස්වීමේ තීරක** | පෞද්ගලික අංශය සංවර්ධනය (PSD) |
| **ස්ත්‍රී/පුරුෂ සමානතාවය සහ මුඛ්‍යධාරා වර්ගීකරණයන්** | වර්ගීකරණය 4: ස්ත්‍රී/පුරුෂ අංග අඩංගු නොවේ (NGE) |
| **ව්‍යාපෘති අනුග්‍රාහකයින්** | හැටන් නැෂනල් බැංකුව පී.එල්.සී |

## මූල්‍යකරණය

| සහායේ වර්ගය/ ප්‍රකාරතාව | අනුමත අංකය | අරමුදල් මූලාශ්‍රය | අනුමත වටිනාකම (දහස්) |
|---|---|---|---|
| පුද්ගලික අංශය | 7434/3229 | අනුපූරක මූල්‍යකරණ යෝජනා ක්‍රමය | ඇ.එ.ජ.ඩො 25,000 |
| පුද්ගලික අංශය | 7434/3229 | LIBOR පදනම් ණය | ඇ.එ.ජ.ඩො 75,000 |
| **මුළු එකතුව** | | | **–** |

## ආරක්ෂණ වර්ගීකරණයන්

ආරක්ෂණ වර්ගීකරණ පිළිබඳව වැඩි විස්තර සඳහා කරුණාකර පහත යොමුවට පිවිසෙන්න
http://www.adb.org/site/safeguards/safeguard-categories

| | |
|---|---|
| **පරිසරය** | FI |
| **ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීම** | FI |
| **ආදිවාසී ජනතාව** | FI |

## පාරිසරික සහ සාමාජයීය අංග පිළිබඳ සාරාංශය

**පාරිසරික අංගය**
FI

**ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීම**
FI

**ආදිවාසී ජනතාව**
FI

## පාර්ශවකරුවන් සමඟ සන්නිවේදනය, සහභාගිත්වය සහ උපදේශනය

**ව්‍යාපෘති සැලසුම්කරණ කාලය අතරතුර**
–

**ව්‍යාපෘතිය ක්‍රියාවට නැන්වීම අතරතුර**
–

## විස්තරය

යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා ණය සැපයීමට ඇ.එ.ජ.ඩොලර් මිලියන 100 දක්වාවූ ණය මුදලකින් ව්‍යාපෘතිය සමන්විත වේ.

## අරමුණු සහ විෂය ක්ෂේත්‍රය

දිගුකාලීන ණය පහසුකම් සහ ශේෂ පත්‍ර සහාය සපයීම හරහා ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පුද්ගලික අංශයේ වාණිජ බැංකුවක් සමඟ කටයුතු කරමින් ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශය තුළ පුද්ගලික අංශයේ සහභාගිත්වය ප්‍රචලිත කිරීමට සහ යටිතල පහසුකම් දියුණු කිරීමේ අවශ්‍යතා සඳහා සහාය වීමට ආසියානු සංවර්ධන බැංකුවට විශේෂිත අවස්ථාවක් පවතී.

## ව්‍යාපෘති සාධාරණීකරණය සහ දේශීය/ කාලාපීය ක්‍රමෝපාය කෙරෙහි ඇති සම්බන්ධය

ආර්ථික වර්ධනය වේගවත් කිරීම, ණය මුදල් සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීම, වේගවත් ආර්ථික වර්ධනය කෙරෙහි ප්‍රධාන බාධකයක් ලෙස සැලකෙන ප්‍රමාණවත් නොවන සහ දුර්වල මට්ටමේ පවතින යටිතල පහසුකම්වල ගුණාත්වය ඉහළ නැංවීම සහ පහළ මට්ටමක පවතින පුද්ගලික අංශයේ ආයෝජන වර්ධනය කිරීම අරමුණු කරගත් රාජ්‍ය සංවර්ධන ප්‍රතිපත්ති ආකෘතිය සමඟ යෝජිත ව්‍යාපෘතිය ඍජුව සම්බන්ධ වේ. ශ්‍රී ලංකාව කෙරෙහිවූ ආසියානු සංවර්ධන බැංකුවේ 2012 සිට 2016 දක්වාවූ 'රාජ්‍ය හවුල්කාර ක්‍රමෝපාය' 'රජයේ සංවර්ධන ප්‍රතිපත්ති සැකිල්ල හා ක්‍රමෝපාය 2020' පාදකව ගොඩනගා ඇති අතර පුද්ගලික අංශ සහභාගිත්වය වේගවත් කිරීමට සහ මූල්‍ය අංශ සංවර්ධනය ප්‍රචලිත කිරීම ඇතුළත්ව පුද්ගලික අංශය සංවර්ධනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ සහය ඉල්ලා ඇත. එසේම මෙම ව්‍යාපෘතිය මගින් යටිතල පහසුකම් දියුණු කිරීම හරහා 'රාජ්‍ය හවුල්කාර ක්‍රමෝපායේ' දක්වා ඇති සමස්ත සහ ධරණීය ආර්ථික වර්ධනයට සහය දක්වයි. එසේම, පුද්ගලික ආයෝජන දිරිගැන්වීමේ සහ ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථික වර්ධනය ප්‍රචලිත කිරීමේ 'ආසියානු සංවර්ධන බැංකුවේ මෙහෙයුම් ව්‍යාපාර සැලැස්ම' සමඟ සමගාමී වන අතර ආසියානු සංවර්ධන බැංකුවේ පුද්ගලික අංශ මෙහෙයුම් දෙපාර්තමේන්තුව හරහා මූල්‍ය අංශය සංවර්ධනය කිරීමටද සහාය වේ. ගැටුම්කාරී කාලයේ සිට ආසියානු සංවර්ධන බැංකුව පුද්ගලික මූල්‍ය අංශයට සහාය දක්වා ඇත. එය 2012 වසරේදී නිවාස මූල්‍යනය කිරීම සඳහා ඩී.එෆ්.සී.සී වර්ධන බැංකුවට ඇ.එ.ජ.ඩොලර් මිලියන 15 ක ජ්‍යේෂ්ඨ ණය පහසුකමක්ද, 2013 වසරේදී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මූල්‍යනය කිරීම සඳහා නේෂන් ට්‍රස්ට් බැංකුවට ඇ.එ.ජ.ඩොලර් මිලියන 15 ක ජ්‍යේෂ්ඨ ණය පහසුකමක්ද ලබා දුනි. ආසියානු සංවර්ධන බැංකුවේ වෙළඳ මූල්‍ය පහසුකම් සැලසීමේ වැඩසටහන යටතේ ශ්‍රී ලාංකික බැංකු අටක් ක්‍රියාකාරීව කටයුතු කරයි.

## ප්‍රතිඵල සහ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය

| ව්‍යාපෘති ප්‍රතිඵල පිළිබඳ විස්තරය | ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳ තත්වයන් (ප්‍රතිඵල, ක්‍රියාකාරකම් සහ කරුණු) |
|---|---|
| – | – |
| **සංවර්ධන අරමුණු පිළිබඳ තත්වයන්** | **මෙහෙයුම්/ ඉදිකිරීම් පිළිබඳ තත්වයන්** |
| – | – |
| **වැදගත් වෙනස්කම්** | |
| – | |

## ව්‍යාපාරික අවස්ථාවන්

| | |
|---|---|
| **පළමු ලැයිස්තුගත කළ දිනය** | – |
| **උපදේශණ සේවාවන්**<br>– | |
| **ප්‍රසම්පාදනය**<br>– | |
| **ප්‍රසම්පාදන සහ උපදේශණ නිවේදන**<br>http://www.adb.org/projects/48302-001/business-opportunities | |

## කාලසටහන

| | |
|---|---|
| සංකල්ප අනුමත කිරීම | 2014 ජූනි 30 |
| තොරතුරු සෙවීම | – |
| කළමණාකරණ සමලෝචන රැස්වීම | – |
| අනුමැතිය | 2014 දෙසැම්බර් 4 |

## සම්බන්ධවීමේ සහ යාවත්කාලීන කිරීමේ විස්තර

| | |
|---|---|
| ආ.ස.බැ වගකිව යුතු නිළධාරී | () |
| ආ.ස.බැ වගකිව යුතු දෙපාර්තමේන්තුව | පුද්ගලික අංශ මෙහෙයුම් දෙපාර්තමේන්තුව |
| ආ.ස.බැ වගකිව යුතු අංශය | පුද්ගලික අංශයේ මූල්‍ය ආයතන අංශය |
| ක්‍රියාවට නැන්වීමේ නියෝජිත ආයතන | – |

## යොමු

| | |
|---|---|
| ව්‍යාපෘති වෙබ් පිටුව | http://www.adb.org/projects/48302-001/main |
| ව්‍යාපෘති ලිපි ලේඛණ ලැයිස්තුව | http://www.adb.org/projects/48302-001/documents |